**ශීර්ෂය - 404 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 විගණන මතය

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 අගෝස්තු 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

**(ආ)** ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2. 1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වෙන්කර තිබූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් වැය විෂයයන් 7කට අදාල රු. 11,460,000 ක් සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි. | 2021 වර්ෂයේ පැවති කොවිඩ් 19 තත්ත්වය මත ඇති වූ නොවැළැක්විය හැකි හේතු මත කාර්යාල කටයුතු සීමා වීම, ඉල්ලුම් කළ සියළු අත්මුදල් නොලැබීම මෙම ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු වී ඇති බව. | පවතින තත්ත්වයන් යටතේ වෙන් කර ඇති ප්‍රතිපාදන උපරිම වශයෙන් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුවීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වෙන්කර තිබූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් වැය විෂයයන් 11කට අදාලව රු.619,920,621ක් උපයෝජනය නොකර ඉතිරිවී තිබූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයේ සියයට 25 සිට සියයට 91 දක්වා පරාසයක පැවතුණි. | - එම - | - එම - |
| (ඇ) | මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව එක් එක් වැය විෂයන් මඟින් ප්‍රතිපාදන වෙනත් වැය විෂයන් වෙත මාරු කිරීම් කර තිබුණ ද එසේ මාරු කර තිබූ ප්‍රතිපාදනවලින් අවස්ථා 03 කදී එකතුව රු.143,979,702 ක් වූ ප්‍රතිපාදන ඉතිරිව පැවති අතර එය සියයට 56 සිට සියයට 100 දක්වා පරාසයක පැවතුණි. | 2021 වර්ෂයේ පැවති කොවිඩ් 19 තත්ත්වය මත ඇති වූ නොවැළැක්විය හැකි හේතු මත කාර්යාල කටයුතු සීමා වීම සහ වියදම් දැරීම සඳහා බිල් ඉදිරිපත් නොවූ බව. | මු.රෙ.66 මාරු කිරීමේ ප්‍රතිපාදන උපරිම ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුවීම. |
| (ඈ) | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ගණන්දීමේ නිලධාරියා විසින් ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් හා නිවැරදිව පිළියෙල කර ඇති බවට හා සකසුරුවම්ව සහ කාර්යක්ෂමතාව ගැන නිසි සැලකිල්ලෙන් යුක්තව ඇස්තමේන්තු සම්පාදනය කර තිබෙන බවට විශේෂයෙන් | මු.රෙ 66 යටතේ ප්‍රතිපාදන සළසා ගැනීම මෙම වෙනස්කම්වලට හේතු වී තිබූ බව. | සිදුවිය හැකි විචලනයන් සැළකිල්ලට ගෙන අවම සංශෝධනයන්ට යටත්වන පරිදි ඇස්තමේන්තු පිළියෙල කිරීමට වග බලා ගත යුතුවීම. |

වගබලා ගත යුතු විය. එහෙත් අමාත්‍යාංශයේ වැය විෂයන් 15 කට අදාළව රු. 200,000 සිට රු.4,760,000 ක පරාසයකින් වැය ඇස්තමේන්තු සංශෝධනයට ලක්කර තිබූ අතර එය සියයට 40 සිට සියයට 190 දක්වා පරාසයක විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 වර්ෂයේ ඇති වූ කොවිඩ් 19 වසංගත තත්ත්වය මත පාසල් වසා දැමීම හේතුවෙන් අධ්‍යාපන කටයුතුවලට බාධා ඇති වූ සිසුන්ගේ අධ්‍යාපන කටයුතු අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා ගුරු ගෙදර අධ්‍යාපනික වැඩ සටහන් විකාශනය කිරීම වෙනුවෙන් 2020 හා 2021 වර්ෂවලදී පිළිවෙලින් රු.මිලියන 28.6 ක් හා රු.මිලියන 198.3 ක් ලෙස රු.මිලියන 226.9 ක් ජාතික රූපවාහිනිය වෙත ගෙවා තිබුණි. එහෙත් මෙම වැඩ සටහන් පාසල් ශිෂ්‍යාවන් කොපමණ ප්‍රමාණයක් නරඹා ඇද්ද යන්න පිළිබඳ පසු විපරමක් කර අමාත්‍යාංශය විසින් වැඩ සටහනේ ඵලදායීතාව පිළිබඳ ඇගයීමක් සිදු කර නොතිබුණි. | ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනය සඳහා දුරස්ථ ඉගෙනුම් පිළිබඳ චක්‍රලේඛය සහ මාර්ගෝපදේශයන්හි චක්‍රලේඛ අංක 15/2021 දරන 2021. 07.19 දිනැති, ආකෘති අංක 2-7 මගින්, වැඩසටහන් නරඹන ලද ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳව තොරතුරු විධිමත්ව ලබා ගැනීමට කටයුතු කර ඇති බව. | විකාශනය කරනු ලබන අධ්‍යාපනික වැඩසටහන්වල ඵලදායීතාව පසුවිපරමට ලක් කර අඩු ඵලදායීතා මට්ටමක් පවතී නම් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2021 අයවැය යෝජනා යටතේ කලාපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපන මධ්‍යස්ථානයන්හි “e තක්ෂිලාව” ඉගෙනුම් කළමනාකරණ පද්ධතියේ භාවිතය සඳහා රාජ්‍ය අමාත්‍යාංශය විසින් පළාත් නවයෙහි වූ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු තුළ චිත්‍රාගාර ඉදිකිරීමේ යෝජනාව මත උපකරණ මිලදී ගෙන තිබුණ ද වාර්තාවේ දිනය දක්වාම පළාත් 05 ක චිත්‍රාගාර ස්ථාපිත කර නොතිබීම හේතුවෙන් එම පළාත් වෙත ලබා දී තිබූ පිරිවැය රු.15,273,225 ක් වූ උපකරණ නිශ්ක්‍රීයව පැවතුණි. | 2022.04.26 වන දින අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය මගින් දේශීය අරමුදල් යොදාගෙන කරනු ලබන ව්‍යාපෘති වලට අදාළ වියදම් තාවකාලිකව අත්හිටුවා ඇත. එම නිසා මෙම කාර්යයන් තාවකාලිකව නවතා ඇතත් මෙම තත්ත්වය යථා තත්ත්වයට පත් වූ විට අදාළ කාර්යයන් සිදු කිරීමට කටයුතු කරනු ලබන බව. | වැයකර ඇති අරමුදල් තුළින් අදාළ අරමුණ ඉටු කර ගැනීමටත් මිලදී ගෙන ඇති උපකරණවල වගකීම් කාලය ඉකුත් වීමට පෙර ප්‍රමාදයකින් තොරව අදාළ උපකරණ භාවිතයට ගැනීමටත් කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුවීම. |

## 3.2 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළ පූර්ව අවශ්‍යතා හඳුනාගෙන ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කිරීමකින් තොරව රු.මිලියන 3.2 ක් වටිනා කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කරන අවස්ථාව වන විට එම කාර්යාලීය උපකරණ අවශ්‍යතා හඳුනාගෙන නොතිබූ අතර ප්‍රතිශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙළ කරන අවස්ථාවේ අතපසුවීමකින් මෙම කාර්යාල උපකරණ වලට අදාළ තොරතුරු ඇතුලත් කිරීමට නොහැකි වී ඇති බව. | සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම සියළු මිලදී ගැනීම් ආවරණය වන පරිදි පිළියෙල කළ යුතුවීම. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) තනතුරේ වැඩ බැලීම සඳහා විධිමත් පත්වීම් ලිපියක් නිකුත් කිරීමකින් තොරව 2020 නොවැම්බර් 30 දින සිට බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (සැලසුම්) තනතුරේ රාජකාරි ආවරණය කිරීම සඳහා නිලධාරියෙකු පත් කර තිබූ අතර එදින සිට වාර්තාවේ දිනය දක්වාම කිසිඳු දීමනාවක් ද ගෙවා නොතිබුණි. | මෙම නිලධාරියා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ 2020.11.30 දිනැති ලිපිය මගින් මෙම අමාත්‍යාංශයට තාවකාලිකව අනුයුක්ත කර ඇති අතර, අභ්‍යන්තර අනුයුක්ත කිරීම මැයෙන් වූ ED/RFF/02/01/01 හා 2020.12.04 දිනැති ලිපිය මගින් අමාත්‍යාංශ ලේකම් විසින් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අංශයේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරෙහි රාජකාරී ආවරණය සඳහා මෙම නිලධාරියා පත් කර ඇත. එසේම විධිමත් පත්වීම් ලිපියක් නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනගෙන යන බව. | විධිමත් පත්වීම් ලිපියක් මත වැඩ බැලීමේ පත්වීම් සිදුකළ යුතු වීම. |